පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 77

ආයතනයේ නම : කෘෂිකර්ම අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : අංක 77

ආයතනයේ නම : කෘෂිකර්ම අමාත්‍යාංශය

එළවළු බීජ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියේ කාර්යසාධන ඇගයීම පිළිබඳ විගණන වාර්තාව විමර්ශනය කරන ලද දිනය - 2022 නොවැම්බර් 08	
කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	කම්ටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
01. බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය	
බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා 2003 අංක 22 දරණ බීජ පනත ප්‍රකාශයට පත්කර, එය පාර්ලිමේන්තුවේ සම්මත වී ඇති බවත්, රාජ්‍ය ප්‍රතිපත්තියේ සඳහන් කරුණුවලට නීතිමය ප්‍රතිපාදන ලැබී ඇති බැවින්, රෙගුලාසි සකස් කර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති බවත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී (ප්‍ර.ග.නි.) / ගණන්දීමේ නිලධාරී (ග.නි.) සඳහන් කළේය.	1. 1997 මාර්තු මාසයේදී කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් අමාත්‍යාංශය මඟින් යොමුකර ඇති බීජ හා රෝපණ ද්‍රව්‍ය කර්මාන්තය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියෙහි 3 (ඉ) හි බීජ පනතක් සම්මත කරගන්නා ලෙස සඳහන් කර ඇති අතර, ඒ අනුව බීජ ප්‍රතිපත්තියෙහි සඳහන් කරුණු ආවරණය වන පරිදි 2003 අංක 22 දරණ බීජ පනත ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර ඇත. 2. ඒ අනුව, බීජ පනත පාර්ලිමේන්තුවේ සම්මත වී ඇති බැවින් රාජ්‍ය ප්‍රතිපත්තියේ සඳහන් කරුණු සඳහා නෛතික බලයක් ලැබී ඇති හෙයින් රෙගුලාසි සකස් කර නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත. 3. 2003 අංක 22 දරණ බීජ පනතේ 18 වන වගන්තිය ප්‍රකාරව නියෝග සකස් කර නියෝගවල දළ කෙටුම්පත් 2016.12.09 දින සිංහල හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන්ද 2017.03.10 දින දෙමළ භාෂා මාධ්‍යයෙන්ද කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. 4. බීජ පනතට අදාළ නියෝග කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක 3/1/2/Seed

	act හා 2017.02.15 දිනැති ලිපිය මඟින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. 5. නීති කෙටුම්පත් සම්පාදක විසින් 2018 මැයි මස රෙගුලාසිවල පළමු කෙටුම්පත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒවා පරීක්ෂා කර 2018.08.14 දින අදාළ කෙටුම්පත සඳහා නිරීක්ෂණ කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු එය නැවත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. .6. නීති කෙටුම්පත් සම්පාදක විසින් තවදුරටත් පැහැදිළි කිරීම අවශ්‍ය බව දුරකතනයෙන් දන්වා ඇති අතර, 2021.09.29 දින මාර්ගගත ක්‍රමය ඔස්සේ සාකච්ඡා කර අදාළ පැහැදිළිකිරීම් සිදුකරන ලදි. 7. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ 2022.01.21 දිනැති ලිපියෙන් උක්ත නියෝග කඩිනමින් කෙටුම්පත් කර දෙන ලෙස නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. 8. අදාළ කෙටුම්පත 2023.01.08 දින නිරීක්ෂණ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර, 2023.04.27 දින කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ඒවාට අදාළ නිරීක්ෂණ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. කෙසේ වුවත්, තවදුරටත් රෙගුලාසි කඩිනමින් අනුමත කරගැනීමට බීජ සභාවේදී සාකච්ඡා කල අතර, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත දැන්වීමට කටයුතු කිරීමට තීරණය කර ඇත.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

02. බීජ ආනයනය හේතුවෙන් බීජ මිළ ඉහළ යාම.

එළවළු බීජ නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතුව වැඩසටහනක් පවතින බවද, විශේෂිත වූ තාක්ෂණික ක්‍රියාදාමයක් ඔස්සේ බීජ නිෂ්පාදනය සිදුකරන බවත්, ලංකාවේ දේශගුණික තත්ත්වය මත දේශීයව නිපදවිය නොහැකි බීජ වර්ග තිබෙන බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි සඳහන් කළේය. එසේම, ප්‍රධාන වශයෙන් බීජ වර්ග 18 ක් පමණ දේශීයව නිපදවන බවද, බීජ වර්ග 26 ක් පමණ ආනයනය කරන බවද, එලෙස පෞද්ගලික ආයතන විසින් ආනයනය කෙරෙන සෑම බීජ වර්ගයක්ම පැළෑටි නිරෝධායන සේවය හරහා තත්ත්ව පරීක්ෂා කොට නිසිපරිදි නියාමනය කරන බවද කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. සඳහන් කළේය. පෞද්ගලික අංශයට සාපේක්ෂව කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් ලබාදෙන දෙමුහුන් බීජවල මිළ ගණන් ඉතාම අඩු බවත්, ගොවියාට සහනදීමේ අරමුණින් සහනදායී මිළ ගණන්වලට බීජ ලබාදීමට තමන්ට හැකි බවත් ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් මෑතකදී හඳුන්වා දුන් නව එළවළු බෝග 2 ක් වන එළබටු ප්‍රභේද 02 ක් හා පුහුල් ප්‍රභේද 01 ක් ඇතුළුව දැනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිෂ්පාදනය කරනු ලබන එළවළු බෝග වර්ග 20 ක ප්‍රභේද 47 ක දෙමුහුම් ප්‍රභේද 8 ක් ඇතුළුව බීජ ගුණනය කර වගාවන් සඳහා ගොවීන් වෙත නිකුත් කරමින් පවතී. මීට අමතරව දේශීයව නිෂ්පාදනය කිරීමට අපහසු බෝග වන කැරට් හා ජපන් බෝල රාබු බීජ නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ වන විට පර්යේෂණ මට්ටමෙන් යොමුවී ඇත. දේශීය බීජ නිෂ්පාදනය තවදුරටත් පුළුල්කිරීම හා ආනයනය සීමාකිරීම අපේක්ෂාවෙන් දේශීයව නිෂ්පාදනය කල හැකි බීජ වර්ග හා දේශීය දෙමුහුන් බීජ නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව රාජ්‍ය, අර්ධ රාජ්‍ය ආයතන හා පෞද්ගලික අංශය ඒකාබද්ධ වැඩසටහනක් මේ වන විට සිදුකරමින් පවතී. ඒ අනුව, බීජ ආනයනය ක්‍රමානුකූලව අඩුකිරීම සඳහා කෙටි, මධ්‍ය හා දිගුකාලීන සැලසුම් සකස් කර (රාජ්‍ය හා පෞද්ගලික අංශය ඒකාබද්ධ වෙමින්) මේවන විට ක්‍රියාත්මක කරමින් පවතී. මෙහිදී රාජ්‍ය අංශයට හා පුද්ගලික අංශයට අවශ්‍ය මූලික බීජ නිෂ්පාදනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර, බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා යෙදවුම් රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන හා පුද්ගලික ආයතන මඟින් සපයාගනු ලබයි. ඒ අනුව, මේ වන විට ක්‍රියාත්මක කෘෂි නව්‍යකරණ ව්‍යාපෘතිය මඟින් පෞද්ගලික ගොවි පොකුරු (Farmer Clusters) තුළින් බීජ නිෂ්පාදකයින් ඇතිකර අවශ්‍ය යටිතල පහසුකම් (ආරක්ෂිත ගෘහ) යෙදවුම් හා තාක්ෂණය ලබාදී ඔවුන් බීජ නිෂ්පාදන ව්‍යවසායකයින් බවට පත්කිරීම සිදුකරයි. එම ව්‍යාපෘතිය මඟින් මහනුවර දිස්ත්‍රික්කයේ ගොවීන් 75 ක් සඳහා ආරක්ෂිත ගෘහ ලබාදී දේශීය දෙමුහුන් එළවළු බීජ නිෂ්පාදනය සඳහා යොමුවී ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ දෙමුහුන් බීජ නිෂ්පාදනය 2023/24 මහ කන්නයේ සිට ආරම්භ

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කිරීමට අපේක්ෂිතය.

මීට අමතරව, FAO, KOPIA ව්‍යාපෘති මඟින් දේශීයව දෙමුහුන් බීජ නිෂ්පාදනය වැඩිකර දේශීයව බීජ සුලභ කිරීම තුළින් බීජ මිළ පාලනය කිරීම සඳහා කටයුතු කර ඇත.

දේශීය බීජ නිෂ්පාදනයේදී දේශගුණික බලපෑම් තුළින් ඇතිවන අපගමනයන් වළක්වා ගැනීම සඳහා බීජ නිෂ්පාදන ගොවිපල් තුළ ආරක්ෂිත ගෘහ වැසි ආවරණ, බිංදු හා විසිරුම් ජලසම්පාදන ක්‍රම හඳුන්වාදී ඇත.

එළවළු බීජ ආනයනය සීමාකිරීම, දේශීය බීජ නිෂ්පාදනය වැඩිකිරීම හා ගුණාත්මය තහවුරු කිරීම, බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීම ආදී එළවළු බීජ නිෂ්පාදන ගොවිපල් වැඩිදියුණු කිරීම හා එළවළු බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා 2023 වර්ෂයේ රු.මි. 1000 ක ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කල අතර, එම ව්‍යාපෘති වාර්තාව සඳහා මෙම වර්ෂය තුළ මුදල් ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුනොවුණි.

නමුත්, 2023 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් වෙන්වූ මුදලින් දේශීය එළවළු බීජ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණින් පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටුකිරීමට 2023 වර්ෂයේ මේ වන විට කටයුතු කරමින් පවතී.

- ඒ අනුව, කඩිනම් ගොවිපල් සංවර්ධන වැඩසටහන යටතේ කුණ්ඩසාලේ හා අඹේපුස්ස ගොවිපලවල වැසි ආවරණ 10 ක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, කුණ්ඩසාලේ ගොවිපලේ වැසි ආවරණ 05 ක ඉදිකිරීම් කටයුතු 2023.08.31 දිනට අවසන් කර 2023/24 මහ කන්නයේ සිට බීජ නිෂ්පාදනයට යොදවා ගැනීමට සැලසුම් කර ඇත. අඹේපුස්ස ගොවිපලේ ඉදිකිරීම් කටයුතු මේ වන විට ඉදිවෙමින් පවතී.

- තවද, කුණ්ඩසාල ගොවිපලේ හෙක්ටයාර 05 ක බිංදු ජල සම්පාදන පද්ධති ප්‍රතිසංස්කරණය කර වගාවන් සඳහා මේ වන විට සූදානම් කර ඇත.

- මීට අමතරව, කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන වලින් කුණ්ඩසාලේ ගොවිපලට වැසි ආවරණ 05 ක් වල්පිට, පස්යාල, වීරපාන ගොවිපල් සඳහා වැසි

ජානක ධර්මසිරිත්
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ආවරණ 02 බැගින්ද, තෙලිජ්ජවිල ගොවිපලට එක් වැසි ආවරණයක් වශයෙන්ද වැසි ආවරණ 12 ක් ඉදිකර එළවළු බීජ නිෂ්පාදනයට යොමුකිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතී.

- කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් වෙන්වූ මුදලින් වල්පිට ගොවිපලේ ජල සම්පාදන පද්ධතිය හා කෘෂි ළිඳක් ඉදිකර එළවළු බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී.

- බීජ මිළදීගැනීම හා බෙදාහැරීමේ ව්‍යාපෘතිය මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ලද රු.මි. 750 ක මුදලින් රු.මි. 75 ක් එළවළු බීජ නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇති අතර, එමඟින් 2023 වර්ෂය තුළ එළවළු බීජ මෙ.ටො. 25 ක් කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩසටහන යටතේ මිළදීගැනීමට සැලසුම් කර ඇති අතර, 2023.08.31 දින වන විට රු.මි. 53 ක් වියදම් කර මෙ.ටො. 18 ක් මිළදීගැනීමට හැකිවී ඇත.

- මෙම කොන්ත්‍රාත් බීජ වැඩසටහනට අමතරව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් රජයේ මූලික බීජ නිෂ්පාදන ගොවිපල් තුළ මූලික එළවළු බීජ මෙ.ටො. 10-12 දක්වා ප්‍රමාණයක් නිපදවීමට අපේක්ෂා කෙරේ.

මීට අමතරව, ආනයනික ප්‍රභේද හා තරහ කල හැකි එළවළු ප්‍රභේද දේශීයව අභිජනනය සඳහා අභිජනන පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදුකෙරේ.

නව ජාන සම්පත් මඟින් ප්‍රභේද අභිජනන කටයුතු අඛණ්ඩව සිදුකරන අතර, වැඩි ඉල්ලුමක් පවතින දේශීය ජාන සම්පත් මෙන්ම ප්‍රතිරෝධී ප්‍රභේද සහ නව ලක්ෂණ මුහුම්කරණය මඟින් එළවළු අභිජනන කටයුතු බෝංචි, වම්බටු ,තක්කාලි ,මාළුමිරිස් , දඹුල ,කරවිල, බතල වර්ග ,පිපිඤ්ඤා, බණ්ඩක්කා, පතෝල, මෑ, වැටකොළු ආදිය සඳහා සිදුකෙරෙමින් පවතී.

මේ වන විට උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් නිදහස් කර ඇති ආනයනික බීජ සමඟ තරහ කල හැකි දේශීයව අභිජනනය කල එළවළු ප්‍රභේද බොහොමයක් සඳහා අභිජනන බීජ හා මව්පිය පෙළපත් බීජ නිෂ්පාදනය අඛණ්ඩව

කේ.ජී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

සිදුකෙරේ .එම දෙමුහුම් ප්‍රභේද හා විවෘත පරාගණ ප්‍රභේද ද බීජ නිෂ්පාදනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ අංශයෙන් මෙන්ම ගොවීන්ගේ සහභාගීත්වයෙන්ද පසුගිය කන්නයේ සිදුකල අතර, ඉදිරි කන්නයේද බීජ නිෂ්පාදනය සඳහා මව්පිය පෙළපත් බීජ ලබාදී ඇත .මෙමඟින් ඉතාම තරහකාරී ජනප්‍රිය දෙමුහුම් ප්‍රභේදයන් වන හෝඩි ලේන ඉරි, අමන්දා යන වම්බටු ප්‍රභේදයන්ද, ප්‍රාර්ථනා දෙමුහුම් මාළුම්රිස් ප්‍රභේදය ද, භාතිය, HORDI HY 3 යන තක්කාලි ප්‍රභේදයන්ද, නිරෝගී කරවිල දෙමුහුම් ප්‍රභේදයන්හි බීජ නිෂ්පාදනය සිදුකෙරේ. විවෘත පරාගිත ප්‍රභේද නම් කරවිල (තින්නවේලි සුදු, මාතලේ කොළ), පතෝල (තින්නවේලි, TA 2, MI short), බණ්ඩක්කා (හරිත) ආදිය වේ. එලෙසම පාරිභෝගික ඉල්ලුමට ගැලපෙන වැඩි අස්වැන්න සහ ඉහළ ගුණාත්මයක් සහිත එළවළු අභිජනන කටයුතු උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් අඛණ්ඩව සිදුකරන අතර, ඉදිරියේදී නිර්දේශ කිරීමට බලාපොරොත්තු වන දෙමුහුම් සහ විවෘත පරාගණ ප්‍රභේද 5ක් ප්‍රභේද නිදහස් කිරීමේ කටයුතු සඳහා යොමුකරන ලදි .තවත් ප්‍රභේද 5ක් NCVT, VAT පර්යේෂණ මට්ටමේ මෙම කන්නයේද ක්ෂේත්‍ර පර්යේෂණ සඳහා යොමුකර පවතී.

ගොවීන්ගේ ප්‍රභේද හා බීජ අවශ්‍යතාව හඳුනාගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ පළාත්-කෘෂිකර්ම දෙපාර්තමේන්තු ව්‍යාප්ත අංශ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වෙන පළාත් තාක්ෂණ ක්‍රියාකාරී කමිටු රැස්වීම් සඳහා මෙන්ම ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහන් සඳහා සහභාගිවීමෙන් තොරතුරු ලබාගන්නා ලදි. දැනට නිර්දේශිත එළවළු ප්‍රභේදයන්හි බීජ ගොවීන් වෙත ලබාදීම සඳහා වන නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අභිජනන බීජ සහ දෙමුහුම් ප්‍රභේද සඳහා අවශ්‍ය මව්පිය පෙළපත් බීජ නිෂ්පාදනය අඛණ්ඩව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් සිදුකෙරේ .මෙම ක්‍රියාවලියේදී සියළු බීජ අභිජනන නිලධාරීන් සහ බීජ සහතික කිරීමේ සේවයේ නිලධාරීන්ගේ පූර්ණ අධීක්ෂණයෙන් මෙම ක්‍රියාවලිය සිදුවන අතර, එමඟින් බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයේ බීජ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා බීජ සැපයීම සිදුකෙරේ. මෙම අභිජනන බීජ නිෂ්පාදන ක්‍රියාවලිය මෙම කන්නයන්හිද සිදුකෙරේ .

ගොවීන්ගේ වගාවන් සම්බන්ධ ගැටළු සහ ප්‍රභේද හා බීජ අවශ්‍යතාව හඳුනාගැනීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ පළාත්-කෘෂිකර්ම දෙපාර්තමේන්තු ව්‍යාප්ත අංශ නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලැබේ .එමඟින් හඳුනාගත් ගැටළු සඳහා දැනටමත් උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මඟින් එළවළු ප්‍රභේද සඳහා පවතින

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කේ.පී.ඩී.එච්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

විවිධ රෝග හා පළිබෝධ වැනි ගැටළු හඳුනාගෙන ඇති අතර ,නව ප්‍රභේද අභිජනනයේදී වඩා ප්‍රතිරෝධී ප්‍රභේද අභිජනනය සඳහා විශේෂ අවධානය යොමුකරමින් කටයුතු සිදුකරමින් පවතී .එමෙන්ම, දැනට පවතින ප්‍රභේදයන්ට වඩා අස්වැන්න වැඩි , පාරිභෝගික ඉල්ලුම සඳහා ගැළපෙන ප්‍රභේද අභිජනනය සඳහා සිදුකෙරෙන පර්යේෂණ සිදුකෙරෙමින් පවතී .ඒ සඳහා පසුගිය කන්නයේ දත්ත විශ්ලේෂණය ද ඉදිරි කන්නයේ පර්යේෂණ සැලසුම් කිරීමද සිදුවෙමින් පවතී.

ඉහතින් දැක්වූ ක්‍රියාමාර්ගයන් මඟින් එළවළු බෝගවල මෙතෙක් වසරකට සාමාන්‍ය බීජ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 30,000ක් වන අතර, ඉදිරියේදී පෞද්ගලික හා රාජ්‍ය අංශය ඒකාබද්ධ වැඩසටහන් මඟින් බීජ කි.ග්‍රෑ. 105,000 ක් දක්වා වැඩිකිරීමටත්, ඒවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත මිළට අළෙවි කිරීම තුළින් දේශීය මිළ යාමනය වීම අපේක්ෂා කෙරේ.

මේ වන විටත් නව ප්‍රභේද හඳුන්වා දීමටත්, ප්‍රචලිත කිරීමටත් කටයුතු කරමින් එමඟින් ඉදිරියේදී දෙමුහුම් බීජ නිෂ්පාදනය වැඩිකිරීම තුළින් එම බෝග වල බීජ ආනයනය 25-50% දක්වා අඩුකිරීමටද, දේශීයව මෙම බීජ සුලභ කිරීම තුළින් ක්‍රමානුකූලව බීජවල මිළ පහළයාමක් සිදුවනු ඇත.

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රත්මල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මසිරි
ලේකම්
කෘෂිකර්ම සහ වැඩිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රත්මල්වත්ත පටුමග, බත්තරමුල්ල.

03. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල හිඟය

තම කාර්ය මණ්ඩලය දක්ෂ අභිජනන විද්‍යාඥයන්ගෙන් සමන්විත නමුත් කාර්ය මණ්ඩල හිඟය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතුවල පසුබෑමට හේතුවී ඇති බව ග.නි. ප්‍රකාශ කළේය. වසර කිහිපයක් පුරා පවතින නඩු කටයුත්තක් හේතුවෙන් නව බඳවාගැනීම් අත්හිටුවා ඇති බවද, 1210 ක් විය යුතු නියමිත කාර්ය මණ්ඩලයෙන් දැනට සේවයේ යෙදෙන්නේ 453 ක කාර්ය මණ්ඩලයක් පමණක් බවද මෙහිදී අනාවරණය වීම. **<u>නිර්දේශ / නියෝග</u>** මෙම නඩු කටයුතු හැකි ඉක්මණින් නිරාකරණය කරගෙන, නව බඳවාගැනීම් කඩිනම් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. ට නියෝග කරන ලදි.	ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ එවකට පුරප්පාඩු 756 ක් පැවතිය ද, බඳවාගැනීම සම්බන්ධයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර තිබූ SC(FR) 283/2014 අංක දරණ පෙත්සම 2021.03.08 දින විභාග කරන අවස්ථාවේදී පෙත්සම්කරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සම සම්බන්ධයෙන් සමථයකට එළඹීම සඳහා එකඟතාවය පලකර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ 2020.06.30 දිනට පැවති පුරප්පාඩු 678 න් පුරප්පාඩු 310 ක් සඳහා විවෘත පදනම මත බඳවාගැනීමේ ගැසට් නිවේදනයක් හා සංශෝධිත සුදුසුකම් යටතේ සීමිත පදනම මත බඳවාගැනීමේ ගැසට් නිවේදනයක් වශයෙන් වෙන් වෙන්ව සකස් කල ගැසට් නිවේදන දෙකක් මඟින් අයදුම්පත් කැඳවා සීමිත තරඟ විභාගය 2023.02.19 දිනක්, විවෘත තරඟ විභාගය 2023.04.08 හා 09 දෙදිනක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වා ඇත. මේ වන විට සීමිත පදනම මත විභාගය සඳහා පෙනී සිට විභාගය සමත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු මෙන් දෙගුණයක් ලෙස අයදුම්කරුවන්ගේ නාමලේඛනය විභාග දෙපාර්තමේන්තුව විසින් යොමුකර ඇත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය 2023.10.23 දින සිට 2023.10.26 දින දක්වා පැවැත්වීමට කටයුතු කරමින් පවතී. එමඟින් සීමිත පදනම මත පැවති පුරප්පාඩු 148 ක් සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. විවෘත පදනම මත තනතුරු 162 ක් සඳහා බඳවාගැනීමට නියමිත අතර, එම විභාගයේ ප්‍රතිඵල මේ වන තෙක් විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොමැත. එම ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව ඉහතින් දක්වා ඇති පුරප්පාඩු 310 සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. එම බඳවාගැනීම් වලින් පසු 2023.06.30 දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විවෘත පදනම මත පුරප්පාඩු 234 ක් හා සීමිත පදනම මත පුරප්පාඩු 215 ක් වශයෙන් මුළු පුරප්පාඩු ගණන 449 කි. එයින් විවෘත පදනම මත වූ පුරප්පාඩු 234 සඳහා "රජයේ විධායක ශ්‍රේණියට බඳවාගැනීමේ පොදු තරඟ විභාගය" මඟින් බඳවාගැනීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර, එමෙන්ම සීමිත පදනම මත පුරප්පාඩු 215 බඳවාගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රාජමල්වත්ත පාලම, බත්තරමුල්ල.

කේ.ජී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රාජමල්වත්ත පාලම, බත්තරමුල්ල.

04. බීජවලට පාලන මිළක් නොමැතිවීම.

දෙමුහුන් බීජ හා දේශීයව නිෂ්පාදිත බීජ අතර වියදම හා අස්වැන්න සළකන කල පවතින වෙනස සම්බන්ධයෙන් හා එකම බීජ ප්‍රභේදය, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් විකුණන මිළ ගණන් හා සත්‍ය වශයෙන්ම වෙළඳපල තුළ පවතින මිළ ගණන් අතර කිහිප ගුණයකින් විශාල වෙනසක් පැවතීම සම්බන්ධයෙන් කාරක සභාව ප්‍රශ්න කළේය.

දෙමුහුන් බීජවල භාවිත වන "දෙමුහුන් දිරිය" නම් සංකල්පය නිසා දේශීය බීජවලට සාපේක්ෂව දෙමුහුන් බීජවල අස්වැන්න වැඩි බවත්, වර්ධනය වේගවත් බවත්, පොහොරවලට ප්‍රතිචාර දැක්වීම වැඩි බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.

බීජ පනත ප්‍රමුඛත්වය දී ඇත්තේ බීජවල ගුණාත්මක බව නියාමනයට බවත්, බීජවල මිළ නියාමනය කිරීමට ප්‍රතිපාදන සළසා නැති බවත්, පාරිභෝගික සේවා අධිකාරිය හා එක්ව බීජවල මිළ විධිමත්ව නියාමනය කිරීමට සාකච්ඡා කෙරෙමින් පවතින බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ප්‍රකාශ කළේය.

බීජ වල මිළ නියාමනය කිරීම පිළිබඳ රෙගුලාසි සකස් කිරීම

බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියේ සඳහන් කරුණු ආවරණය කරමින් ප්‍රකාශයට පත්කොට ,පාර්ලිමේන්තුවේ සම්මත වී ඇති 2003 අංක 22 දරණ බීජ පනතට අනුකූලව බීජ වල මිළ පාලනය සඳහා පවතින ගැටළු හා එම ගැටළු නිරාකරණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග.

එළවළු බීජ කර්මාන්තයේ මිළ සම්බන්ධ වර්තමාන තත්ත්වය

පුද්ගලික අංශය විසින් දේශීයව විවෘත පරාගිත ප්‍රභේදවල බීජ හා දෙමුහුම් බීජ නිෂ්පාදනය කරන අතරම, වැඩි වශයෙන් ආනයනික ,විවෘත පරාගිත හෝ දෙමුහුම් බීජ සැපයීම ද සිදු කරයි. එළවළු බෝග නිෂ්පාදනයේදී නිෂ්පාදන පිරිවැය ගණනයේදී බීජ සඳහා වන වියදම ප්‍රධාන සාධකයක් වේ. වැයවන පිරිවැයෙන් බීජ සඳහා වන වියදම 3% සිට 10% දක්වා අගයක් ගන්නා අතර, බීජ වල මිළ විශාල වශයෙන් විචලනයක් දක්නට ලැබේ. බීජ වල මිළ ,බෝගය ,ප්‍රභේදය (දෙමුහුම් හෝ විවෘත පරාගිත ප්‍රභේදයක්), ප්‍රභවය (දේශීය ,ආනයනික) ව්‍යවසායකත්වය (රාජ්‍ය ,පුද්ගලික), වෙළඳ ප්‍රවාරණය ආදිය මත විචල්‍යය වේ.

බීජ වල වෙළඳපළ මිළ තීරණය කරන ප්‍රධාන සාධක.

1. විවෘත පරාගිත ප්‍රභේදවල බීජවල මිළ ,බීජ නිෂ්පාදනය ,ප්‍රවාහනය ,ඇසුරුම්කරණ , අලෙවිකරණ වියදම් හා ලාභාංශය මත විචලනය වේ.

2. දේශීයව බීජ නිෂ්පාදනය සැළකීමේදී ජල සම්පාදන ක්‍රම ,ආරක්ෂිත ගෘහ ,ඇසුරුම් සඳහා වන වියදම් ආදිය ස්ථාවර වියදම් සඳහා බලපාන ප්‍රධාන සාධක ලෙස සැළකිය හැකිය .දේශීයව බීජ නිෂ්පාදනය සඳහා වැයවන විචල්‍යය වියදම් ලෙස , වැයවන ශ්‍රමය ,ඉන්ධන ,පොහොර හා කෘෂිරසායන, අස්වනු නෙලීම ,ජල කළමනාකරණය ,රෝග හා පළිබෝධ මර්ධනය ,වල් මර්ධනය ආදිය සඳහා වන වියදම් ප්‍රධාන වියදම් ලෙස ගත හැකිය.

ඩේ.පී.ඩී.එච්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

3. 2003 අංක 22 දරණ බීජ පනත මඟින් බීජ වල ගුණාත්මකභාවය නියාමනය කිරීම සඳහා පහසුකම් සළසා තිබුණද, මිළ නියාමනය සඳහා බලය ලබාදී නොමැත . කෙසේ වුවත්, මේ වන විට වෙළඳපලෙහි ප්‍රධාන කාණ්ඩ 05 ක් (දේශීය විවෘත පරාගිත ,දේශීය දෙමුහුම් ,ආනයනික විවෘත පරාගිත ,ආනයනික දෙමුහුම් , පාරම්පරික ප්‍රභේද ලෙස) යටතේ ඉතා විශාල බීජ වර්ග (බීජ වර්ග 250 ක් පමණ) අළෙවි වේ .ඒවායේ මිළ විශාල පරාසයක විචලනය වේ .මේ අනුව, එක් එක් බෝග ප්‍රභේදය සඳහා මිළ නියම කළ යුතු වුවත් මෙය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් එය ප්‍රායෝගික නොවේ .එබැවින් ඉහත සාධකයන් සියල්ල සැළකිල්ලට ගෙන එක් එක් බෝගය සඳහා උපරිම මිළක් නියම කිරීම සුදුසු වේ.

යෝජනා

1. දේශීය වර්ග ,දේශීයව නිපදවන දෙමුහුම් හා විවෘත පරාගිත බීජ වර්ග සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කමිටුවක් මඟින් කාලානුරූපීව බීජ මිළ නිර්ණය කිරීම.

2. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බීජ නිෂ්පාදනය තවදුරටත් ශක්තිමත් කර තරහකාරීත්වය වැඩිකිරීම.

3. ගොවීන් ,ගොවි සංවිධාන හා පෞද්ගලික අංශයේ දේශීය බීජ නිෂ්පාදනය සඳහා පහසුකම් පුළුල් කර යෙදවුම් සඳහා සහන ලබාදීම තුළින් බීජ නිෂ්පාදකයින් දිරිගැන්වීම.

4. කන්නය ආරම්භයේදී ගොවිබිමට බීජ ගෙනයාමේ වැඩපිළිවෙල පුළුල් කිරීම හා ඒ සඳහා රාජ්‍ය අංශයේ පහසුකම් වැඩිදියුණු කිරීම.

5. කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත්වීම මත වැඩි වශයෙන් වගා වන හා ඉහළ මිළක් සහිත බෝග බීජ සඳහා පමණක් බීජ අළෙවි මිළ නියාමනය කිරීමේ යාන්ත්‍රණයක් පෞද්ගලික අංශයේ සහභාගීත්වයද ඇතිව සැකසීම .

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	6. බීජ නිෂ්පාදකයන් හා අලෙවිකරුවන් සඳහා රක්ෂණාවරණ ක්‍රමයක් ඇතිකිරීම . බීජ සඳහා උපරිම මිළක් නියම කිරීමට කමිටුවක් පත්කිරීම සුදුසු බවට තීරණය කරන ලද අතර, මේ පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි පැවති ජාතික බීජ කමිටුවේදී සාකච්ඡා කරන ලදී. (පෞද්ගලික අංශයත් ඇතුළුව) එහිදී පෞද්ගලික අංශය විසින් මිළ සඳහා පවතින ගැටළු පැහැදිලි කරන ලදි. රජය පෞද්ගලික අංශය සමඟ තවදුරටත් සාකච්ඡා කර මිළ නියාමනය පිළිබඳව තීරණ ගැනීම සුදුසු බව තීරණය කරන ලදි. ඒ අනුව, 2023.11.07 දින සියලු පාර්ශවකරුවන් සමග රැස්වීමක් පැවැත්වීමට සංවිධානය කර ඇත.

කේ.ජී.ඩී.එච්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්ත...

ජානක ධර්මකීර්ති
ලේඛාම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

05. ජාතික කෘෂිකාර්මික සැලැස්මක අවශ්‍යතාවය.

රටේ අවශ්‍යතාවයට අනුව, එක් එක් කාලගුණික තත්ත්වයන්ට ගැළපෙන පරිදි එක් එක් බෝග වගා කල යුතු කාල පිළිබඳ, අදාළ සියලුම රාජ්‍ය ආයතනවල මැදිහත්වීමෙන් සැකසූ ජාතික කෘෂිකාර්මික සැලැස්මක අවශ්‍යතාවය කාරක සභාවේ අවධානයට ලක්විය.

එවන් සැලැස්මක් සකසා තිබෙන නමුත් එහි දුර්වලතා හා බාධක ඇති බව තමන් පිළිගන්නා බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. සඳහන් කළේය. අදාළ සියලු පාර්ශව එකතු කර එම සැලැස්ම බලාත්මක කල යුතු බව හෙතෙම වැඩිදුරටත් සඳහන් කළේය.

<u>නිර්දේශ / නියෝග</u>

රටේ අවශ්‍යතාවයට අනුව වාර්ෂිකව බීජ නිපදවිය යුතු කාලයන් හා ප්‍රමාණ පිළිබඳ සැලැස්ම නිසියාකාරව ක්‍රියාත්මක කිරීමේදී අදාළ දෙපාර්තමේන්තු හා ආයතනවලට පැනනැඟෙන බාධා හා ගැටළු නිබෙනම් ඒවා ප්‍ර.ග.නි. හරහා වාර්තා කරන ලෙස කාරක සභාව මෙහිදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. / ග.නි. ට නියෝග කළේය.

අදාළ ගැටළු, එම ගැටළු විසඳිය හැකි ආකාර පිළිබඳ යෝජනා හා එම යෝජනා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි.

බීජ වී නිෂ්පාදනය හා සැපයීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දායකත්වය.

I. වී නිෂ්පාදනය

වාර්ෂිකව යල හා මහ කන්න වශයෙන් වී නිෂ්පාදනය කිරීම සඳහා හෙක්ටයාර 1,300,000 සඳහා බීජ වී බුසල් 6,500,000 ක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය මූලික බීජ වී ලෙස අත්තිවාරම් බීජ 100% හා ලියාපදිංචි බීජ අවශ්‍යතාවය 90% බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ ගොවිපල් තුළින් නිෂ්පාදනය කර බෙදාහැරීම සහ අලෙවිකිරීම සිදුකරනු ලබයි. **(වගුව - 01)**

වගුව 01 : බීජ වී නිෂ්පාදනය

බෝග කාණ්ඩය	වගා වපසරිය (හෙක්.)	බීජ අවශ්‍යතාවය		වාර්ෂික මුළු අවශ්‍යතාවය
		යල කන්නය	මහ කන්නය	
වී	1,300,000	2,500,000 (බුසල්)	4,000,000 (බුසල්)	6,500,000 (බුසල්)
වෙනත් ක්ෂේත්‍ර බෝග	232,700	1,946 (මෙ.ටො)	3,758 (මෙ.ටො)	5,704 (මෙ.ටො)
එළවළු	70,650	312,865 (කි.ග්‍රෑ)	385,067 (කි.ග්‍රෑ)	697,932 (කි.ග්‍රෑ)
අර්තාපල්	5,500	6,200 (මෙ.ටො)	6,500 (මෙ.ටො)	12,700 (මෙ.ටො)

තවද, මෑත කාලයේදී හඳුන්වා දී ඇති උසස් ගුණාත්මයෙන් යුත් නව ප්‍රභේද ඇතුළත් දිවයිනේ විවිධ දේශගුණික කලාපයන්ට ගැලපෙන වී ප්‍රභේද 42 ක බීජ වී නිෂ්පාදනය සිදුකරයි. එමෙන්ම, ඉදිරි කන්නය සඳහා අවශ්‍ය බීජ ප්‍රමාණය නිෂ්පාදනය කරගැනීමට හැකිවන පරිදි මූලික බීජ අන්තර් පළාත්, පළාත්, මහවැලි අධිකාරියට, පුද්ගලික සමාගම්, ලියාපදිංචි පුද්ගලික නිෂ්පාදකයින්ට සැපයීම සිදුකරයි.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කේ.පී.ඩී.එච්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	I. <u>වෙනත් ක්ෂේත්‍ර බෝග</u> වී බෝගයට අමතරව දේශීය බීජ අවශ්‍යතාවයෙන් වැඩිම අවශ්‍යතාවයක් ඇති බෝග කාණ්ඩය වන්නේ, වෙනත් ක්ෂේත්‍ර බෝග වේ. ඒ යටතේ මුං, රටකජු, සෝයා, බඩඉරිඟු, උඳු, කව්පි, කුරක්කන්, තල සහ ලොකුළුණු, මිරිස් යන බෝග අයත් වේ. මෙම බෝගවල මූලික බීජ නිෂ්පාදනය රජයේ බීජ නිෂ්පාදන ගොවිපල්වල සිදුකරන අතර, ලියාපදිංචි හා කොන්ත්‍රාත් බීජ නිෂ්පාදනය ගොවීන් මඟින් සිදුකරනු ලැබේ. එමඟින් ජාතික මූලික බීජ අවශ්‍යතාවයෙන් 100% මුං, උඳු, කුරක්කන්, කව්පි, තල, සෝයා, මිරිස් යන බෝගවලින් ලබාදෙන අතර, රටකජු 20%, ලොකුළුණු 12.5% වර්තමානයේ ලබාදෙන අතර, රතුළුණු මූලික බීජ නිෂ්පාදනය මේවන විට ආරම්භ කර ඇත. තවද, දෙමුහුම් බඩඉරිඟු ජාතික බීජ අවශ්‍යතාවයෙන් 15% ක් නිෂ්පාදනය සඳහා අවශ්‍ය මව්පිය පෙළපත් බීජ නිෂ්පාදනය කරන අතර, එම ප්‍රමාණය 2025-2028 කාලය තුළදී ජාතික අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට සැලසුම් සකස් කර ඇත. ඒ අනුව, මේ වන විට වෙනත් ක්ෂේත්‍ර බෝගවල මූලික බීජ කි.ග්‍රෑ 100,000 ක් නිෂ්පාදනය කර බෙදාහැරීම සිදුකරයි. මීට අමතරව ගොවීන්ගේ බීජ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා සහනික බීජ කි.ග්‍රෑ. 800,000 ක් සෘජුවම ගොවීන් වෙත අලෙවිකිරීම සිදුකරයි. මෙහිදී මුං, උඳු, කුරක්කන්, තල, සෝයා, මිරිස් යන බෝගවල ජාතික බීජ අවශ්‍යතාවයෙන් ඒ ඒ බෝග අනුව 25% සිට 50% පරාසයක බීජ වාර්ෂිකව නිකුත් කරනු ලැබේ. මීට අමතරව මිරිස් බීජ, ලොකුළුණු හා බඩඉරිඟු බීජ නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශයද දායකත්වයක් දක්වනු ලබන අතර, මෙම බීජ වර්ග වාර්ෂික අවශ්‍යතාවය අනුව ආනයනය කිරීමට කටයුතු කෙරේ. **(වගුව 02)**

ඩබ්.පී.සී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

වගුව 02: අතිරේක ආහාර බෝග බීජ සැපයුම් ක්‍රියාවලිය

බෝග		මුළු බීජ අවශ්‍යතාවය (මෙ.ටො.)	දේශීය බීජ නිෂ්පාදනය					ආනයනික (මෙ.ටො.)	%
			කෘ.දෙ. (මෙ.ටො.)	ගොවීන් සහ පෞද්ගලික අංශය	ASMP (මෙ.ටො.)	මුළු එකතුව (මෙ.ටො)	%		
මුං		575	170	405		575	100%		
උඳු		500	150	350		500	100%		
කව්පි		700	45	655		700	100%		
රටකජු		2000	100	1892	8	2000	100%		
සෝයා		300	130	170		300	100%		
කුරක්කන්		41	11	30		41	100%		
තල		105	24	81		105	100%		
බඩ ඉරිඟු	විවෘත පරාගික	76	76	0		76	100%		
	දෙමුහුම් (F1)	1368	50	0	90	140	10%	1228	90%
මිරිස්	විවෘත පරාගික	10	6	4		10	100%		
	දෙමුහුම් (F1)	3	0.3	1.9	0.5	2.7	90%	0.3	10%
ලොකුළූණු		26		13	10	23	89%	3	11%
එකතුව		**5704.3**	**762.3**	**3602.2**	**108.5**	**4473**		**1231.3**	

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරි
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

III. එළවළු බීජ

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නිර්දේශිත එළවළු බෝග 19 ක ප්‍රභේද 72 ක මූලික බීජ රජයේ ගොවිපලවල නිෂ්පාදනය කරනු ලබන අතර, කොන්ත්‍රාත් ගොවීන් සමඟ ඇතිකරගත් ගිවිසුම්ගත ක්‍රමයක් මඟින් හා පුද්ගලික අංශයේ නිෂ්පාදන දායකත්වය මඟින් දේශීය එළවළු බීජ අවශ්‍යතාවය සපුරාගනී. **(වගුව - 03)**

වගුව 03 : ජාතික එළවළු බීජ අවශ්‍යතාවය

බෝගය	බීජ අවශ්‍යතාවය (ha/kg)	වපසරිය (ha)			බීජ අවශ්‍යතාවය (kg)		
		යල	මහ	එකතුව	යල	මහ	එකතුව
බෝංචි	50	3,500	4,500	8,000	175,000	225,000	400,000
මෑ	20	4,500	4,500	9,000	90,000	90,000	180,000
බණ්ඩක්කා	4.5	3,200	4,400	7,600	14,400	19,800	34,200
කරවිල	6	1,600	2,500	4,100	9,600	15,000	24,600
රාබු	5	1,300	1,800	3,100	6,500	9,000	15,500
වැටකොළු	3	1,500	3,000	4,500	4,500	9,000	13, 500
පතෝල	4	1,350	1,400	2,750	5,400	5,600	11, 000
වට්ටක්කා	1	2,800	4,950	7,750	2,800	4,950	7,750
මාළුමිරිස්	1	1,500	2,100	3,600	1,500	2,100	3,600
පිපිඤ්ඤා	1	1,200	2,000	3,200	1,200	2,000	3,200
වම්බටු	0.25	4,500	6,150	10,650	1,125	1,537	2,662
තක්කාලි	0.3	2,800	3,600	6,400	840	1,080	1,920
එකතුව		**29,750**	**40,900**	**70,650**	**312,865**	**385,067**	**697,932**

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ගෝවා, බීට්, ලීක්ස්, බ්‍රොකෝලි ආදී බෝග වර්ගයන්හි දේශීයව බීජ නිෂ්පාදනය පවතින සාමාන්‍ය දේශගුණික තත්ත්වයන් හා සාමාන්‍ය බීජ නිෂ්පාදන ක්‍රමවේදයන් යටතේ සිදුකල නොහැකිය. එබැවින් මෙම බීජ වර්ග අවශ්‍යතාවය අනුව ආනයනය කරනු ලබයි. මෙම බීජ වර්ග නිෂ්පාදනය සඳහා පාලිත තත්ත්වයන් සහ විශේෂිත වූ තාක්ෂණික ක්‍රමවේදයන් අවශ්‍ය වන අතර, මේ වන විටත් පර්යේෂණ අංශ මඟින් මේ සඳහා අවශ්‍ය තාක්ෂණික ක්‍රමවේදයන් හඳුනාගෙන එම ක්‍රමවේදයන් ක්ෂේත්‍රයේ අත්හදාබැලීම සිදුකරනු ලබයි. ඒ අනුව, ආනයනික බීජ දේශීයව නිෂ්පාදනය කර ගොවීන් වෙත බීජ නිකුත් කිරීම මධ්‍යකාලීන සැලසුම් අදියරයේදී සිදුකිරීමට අරමුණු කර ඇත. **(ඡායාරූපය 01)**



ඡායාරූපය 01 : මීපිලිමාන රජයේ බීජ ගොවිපලේ කැරට් බීජ නිෂ්පාදනය (නිවි කුරෝඩා)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ලබාදෙන මූලික බීජ යොදාගෙන පෞද්ගලික අංශයද දේශීය බීජ නිෂ්පාදනය සඳහා දායක වේ. **(වගුව 04)**

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

මේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

වගුව 04 : 2022/23 මහ කන්නය සඳහා බීජ ගොවිපල හා පුද්ගලික අංශය වෙත ලබාදුන් මූලික බීජ ප්‍රමාණය සහ අපේක්ෂිත ප්‍රමාණය

බෝගය	ජාතික බීජ අවශ්‍යතාව (kg)	පුද්ගලික අංශය සඳහා		ජාතික බීජ අවශ්‍යතාවයෙන් % ලෙස
		නිකුත් කල මූලික බීජ ප්‍රමාණය (kg)	අපේක්ෂිත සම්මත බීජ ප්‍රමාණය (kg)	
පතෝල	11,000	67	7313	66
බණ්ඩක්කා	34,200	154.3	21383	63
රාබු	15,500	45	6567	42
වැටකොළු	13,500	30	2820	21
පිපිඤ්ඤා	3200	1.6	554	17
තක්කාලි	1,920	1.53	270.85	14
මාළුමිරිස්	3,600	2.6	412.5	11
මෑ	180,000	199	7636	4
කරවිල	24,600	7.3	450	2
වම්බටු	2662	0.1	50	2
බෝංචි	400,000	25	500	0
එකතුව	**690,182**	**533**	**47,956**	

මීට අමතරව පාරම්පරික සහ වෙනත් නුමුහුම් දේශීය ප්‍රභේදවල බීජ නිෂ්පාදනය ගොවීන් විසින්ම සිදුකරනු ලබයි. වර්තමානයේ ගොවීන් වැඩි අස්වැන්නක් සඳහා දෙමුහුම් ප්‍රභේද වගාවට යොමුවී ඇති අතර, එම දෙමුහුම් ප්‍රභේදවල බීජ විශාල ප්‍රමාණයක් ආනයනය කෙරේ. එසේ වුවද, දැනටමත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් රජයේ බීජ නිෂ්පාදන ගොවිපලවල හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් මව්පිය පෙළපත් බීජ පෞද්ගලික ආයතන, අර්ධ රාජ්‍ය ආයතන (මහවැලි), පෞද්ගලික ගොවීන් වෙත ලබාදීම මඟින් දේශීය දෙමුහුන් ප්‍රභේදවල (වම්බටු, මාළුමිරිස්, තක්කාලි, කරවිල, පිපිඤ්ඤා) බීජ නිෂ්පාදනය ආරම්භ කර ඇත. **(වගුව 05)**

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේඛකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

වගුව 05 : වර්තමාන දේශීය එළවළු බීජ සැපයීම

බෝගය	මුළු බීජ අවශ්‍යතාවය (kg)	දේශීය නිෂ්පාදනය (kg)	%	ආනයනය (kg)	%
පතෝල	11,000	11,000	100	0	0
මෑ	180,000	168,000	93	12,000	7
කරවිල	24,600	22,000	89	2,600	11
වම්බටු	2,662	2,100	79	562	21
බෝංචි	400,000	254,000	64	146,000	37
බණ්ඩක්කා	34,200	21,000	61	13,200	39
වැටකොළු	13,500	6,000	44	7,500	56
මාළුමිරිස්	3,600	1,600	44	400	56
රාබු	15,500	6,000	39	11,500	61
තක්කාලි	1,920	520	27	1,400	73
පිපිඤ්ඤා	3,200	730	23	2,470	77
වට්ටක්කා	7,750	500	6	7,250	94
එකතුව	**697,932**	**493,450**	**71**	**203,882**	**29**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය අංශයේ විවිධ ව්‍යාපෘති හා පෞද්ගලික අංශය ඒකාබද්ධව ඉහළ අස්වැන්නක් සහ ගුණාත්මයෙන් යුත් දේශීය දෙමුහුම් හා නුමුහුම් ප්‍රභේදවල බීජ නිෂ්පාදනය ශක්තිමත් කිරීම තුළින් ආනයනික බීජ ප්‍රමාණය අවම කරගැනීම සඳහා කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන ලෙස අදියර තුනකින් යුත් සැලසුම් ක්‍රියාත්මක කර ඇත. **(වගුව 06)**

...ිමකීර්ති
...ලකම්
කෘෂිකර්ම හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය",
රාජමල්වත්ත පාලමඟ, බත්තරමුල්ල.

කේ.ජී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රාජමල්වත්ත පාලමඟ, බත්තරමුල්ල.

වගුව 06 : ආනයනික බීජ ප්‍රමාණය අවම කරගැනීම සඳහා නිෂ්පාදන සැලසුම්

බෝගය	ආනයනික බීජ ප්‍රමාණය (දේශීයව නිෂ්පාදනය කල යුතු බීජ ප්‍රමාණය) (Kg)	කෙටිකාලීන % (2023-2025)	මධ්‍යකාලීන % (2026-2028)	දිගුකාලීන % (2028-2030)
බණ්ඩක්කා	13,200	80	100	100
බෝංචි	146,000	80	100	100
වම්බටු	562	90	100	100
මාළුමිරිස්	400	10	25	100
තක්කාලි	1,400	25	50	100
මෑ	12,000	90	100	100
පැණිකොමඩු	10,000	20	40	80
කරවිල	2,600	25	60	75
පිපිඤ්ඤා	2,470	5	25	75
වැටකොළු	7,500	5	30	75
වට්ටක්කා	7,230	5	20	75
රාබු	11,500	5	40	50
කැරට්	1,400	5	25	40
එකතුව	**216,262**			

ඉහත සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා හා උසස් ගුණාත්මයෙන් යුත් වැඩි අස්වනු ලබාදෙන නව ප්‍රභේදයන්ගේද බීජ ගුණනය කිරීමේ ක්‍රියාවලිය මේවන විට ආරම්භ කර ඇත.

ඒ අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට අයත් ඒකක තුළින් රටෙහි ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම සඳහා මූලික බීජ ගුණනය කිරීම, බෙදාහැරීම හා අළෙවි කිරීමේ කටයුතු සිදුකරනු ලබන අතර, එමඟින් බීජ වී, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ, එළවළු බීජ, බීජ අර්තාපල් හා රෝපණ ද්‍රව්‍ය යන ප්‍රධාන බෝග කාණ්ඩ 5 ක් යටතේ දේශීය බීජ අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටයුතු කරනු ලබයි. එමඟින් රටේ අවශ්‍යතාවයට අනුව වාර්ෂිකව බීජ නිපදවිය යුතු කාලයන් හා ප්‍රමාණයන් පිළිබඳ සැළැස්ම සකස් කරනු ලබන අතර, එහිදී තවදුරටත් පැනනැඟෙන ගැටළු හා බාධාවන් අදාළ පාර්ශවයන් සමඟ සම්බන්ධීකරණය වී නිරාකරණය

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ප්‍රියන්ත කුමුදුනී
මෙයාම
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කරගනිමින්, අදාළ සැලැස්ම ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි.

ගැටළු	යෝජනා
(1.1.) දේශීය වශයෙන් පෞද්ගලික අංශය මඟින් නිපදවන බීජ හා දේශීය ප්‍රභේද වල ගොවීන් විසින් නිපදවන බීජවල දත්ත නොමැති වීම, බීජ නිෂ්පාදන වැඩසටහන් සැලසුම් කිරීම හා ආනයනය සීමාකිරීම ගැටළුවක් වී ඇත.	ග්‍රාම සේවක වසම් මට්ටමින් බීජ නිෂ්පාදනය පිළිබඳ තොරතුරු පද්ධතියක් ඇතිකිරීම හා ඒ අනුව ඒ ඒ පාර්ශවකරුවන් විසින් නිපදවිය යුතු බීජ ප්‍රමාණය හා ආනයනය කල යුතු බීජ ප්‍රමාණය පිළිබඳ ජාතික එකඟතාවයක් ඇතිකිරීම හා විධිමත් අධීක්ෂණ ක්‍රමවේදයක් සැකසීම.
(1.2.) අභිජනන බීජ නිෂ්පාදනය පර්යේෂණ ආයතන 10 ක හා මූලික බීජ නිෂ්පාදනය රජයේ බීජ නිෂ්පාදන ගොවිපල් 16 ක සිදුකරනු ලබයි. මෙම බීජ නිෂ්පාදන කටයුතු බොහෝමයක් විවෘත භූමිය තුළ සිදුකරනු ලබන අතර, නිරන්තරයෙන් ඇතිවන අනපේක්ෂිත අහිතකර කාළගුණ තත්ත්වයන්ට මුහුණදීම නිසා අපේක්ෂිත අස්වනු නොලැබීම හා නියමිත ප්‍රමිතියට අනුකූල නොවීම මත බීජ ප්‍රතික්ෂේප වීම සිදුවේ.	ආරක්ෂිත ගෘහ හා වැසි ආවරණ, ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති වැනි දියුණු වගා තාක්ෂණ ක්‍රමවේද යොදාගැනීම. බීජ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය යෙදවුම් (කෘෂි රසායනික ද්‍රව්‍ය, පොහොර, බිම් සැකසීම සඳහා අවශ්‍ය ඉන්ධන ආදී) නියමිත ප්‍රමාණයන් නියමිත වේලාවට සැපයීම.
(1.3.) බීජ නිෂ්පාදන කටයුතු සිදුකිරීමට අවශ්‍ය කෘෂි විද්‍යාඥයින් හා අනෙකුත් තාක්ෂණික නිලධාරීන්, පුහුණු ශ්‍රමිකයන් ඇතුළු කම්කරුවන්ගේ හිහකම නිසා සැලසුම් කල පරිදි ඉටුකල නොහැකි වීම.	බීජ නිෂ්පාදන ප්‍රමුඛතාවය සැළකිල්ලට ගෙන අදාළ තනතුරු සඳහා බඳවාගැනීම් වාර්ෂිකව අඛණ්ඩව සිදුකිරීමට අවස්ථාව සැලසීම.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

(1.4.) දේශීයව එළවළු බීජ නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේදී බීජ ගබඩා කිරීම සඳහා අවශ්‍ය කරන ශීතාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම.	මූලික, සම්මත හා ස්වාරක්ෂක බීජ තොග ගබඩා කිරීමට දැනට පවතින 70 mt ශීතාගාර පහසුකම් 170 mt දක්වා වැඩි කිරීම.	
(1.5.) ගුණාත්මයෙන් යුත් දේශීය බීජ නිෂ්පාදනය හා සම්බන්ධ ආයතන ඉතා දුෂ්කර ප්‍රදේශ වල පැවතීම. එම ස්ථාන වල සේවය කරන නිලධාරීන්ට අවම පහසුකම් පැවතීම හේතුකොටගෙන දිගුකාලීනව රාජකාරියේ යොදවා ගැනීමට නොහැකිවීම හේතුවෙන් අධීක්ෂණ කාර්යමණ්ඩල ප්‍රමාණවත් නොවීම.	ගොවිපලවල සේවය කිරීම සඳහා නිලධාරීන් ආකර්ෂණය කරගැනීමට හැකි පරිදි ප්‍රමාණවත් පහසුකම් හා දීමනා ලබාදීම. දුෂ්කර ප්‍රදේශ වල රජයේ නිවාස වල පදිංචි නිලධාරීන් / සේවකයන් සඳහා නිවාස කුලී වෙනුවෙන් නිදහස් කිරීම.	
(1.6.) බීජ නිෂ්පාදනයට සම්බන්ධ ගොවිපල / ආයතන විශාල භූමියක / ප්‍රදේශ තුල ව්‍යාප්ත වීම හේතුවෙන් ක්ෂේත්‍ර කටයුතු හා අධීක්ෂණය සඳහා ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීම. (තාක්ෂණික නිලධාරීන් සඳහා සතියකට ලීටර 4 ක් හා රාජකාරී වාහන සඳහා ලීටර 20 ක් කිසිසේත් ප්‍රමාණවත් නොවීම)	ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් (ඉන්ධන හා වාහන) ලබාදීම. ප්‍රමාණවත් ඉන්ධන කෝටාවක් ලබාදීම.	
(1.7.) වගා පිනිටුවන සහ අස්වනු නෙළන කාල සීමාවේදී කම්කරුවන්ගේ දෛනික පැමිණීම අඩුවීම හේතුවෙන් නිසි පරිදි වගා සංස්ථාපනය කිරීමට නොහැකි වීම හා අස්වනු නෙළීම ප්‍රමාදවීම හේතුවෙන් අස්වනු හානි වීම මත හා නිපදවන බීජ ප්‍රමිතිය අඩුවීම මත ප්‍රතික්ෂේප වීමේ සම්භාවිතාවයක් පැවතීම.	ගොවිපල්වල වාර්ෂික කම්කරු ඇස්තමේන්තු සීමාව තුළ අවස්ථානුකූලව කම්කරුවන් (කොන්ත්‍රාත්) යෙදවීමට අනුමැතිය ලබාදීම. (රාජ්‍ය පරිපාලන 25/2004 කම්කරු ස්ථිර කිරීමේ චක්‍රලේඛයට පෙර තිබූ පරිදි) ස්ථිර කම්කරු පුරප්පාඩු පිරවීම.	
(1.8.) කොන්ත්‍රාත් කම්කරුවන් සඳහා ගෙවන වැටුප ප්‍රමාණවත් ලෙස යාවත්කාලීන නොවීම නිසා කම්කරුවන්	කොන්ත්‍රාත් කම්කරු වැටුප ප්‍රමාණවත් ලෙස යාවත්කාලීන කිරීම.	

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	ආයතනයෙන් බැහැර වෙනත් බාහිර කාර්යයන් සඳහා යොමුවීම.		
	(1.9.) සැළසුම් සහගතව සිදුකරන ලද බීජ නිෂ්පාදන වගාවන් වන සතුන්ගෙන් හානි වීම (මොණරු,වන අලි) .	බීජ නිෂ්පාදන කටයුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා බීජ නිෂ්පාදන ගොවිපල් ආරක්ෂා කරගැනීම.	
	(1.10.) බීජ නිෂ්පාදන ගොවිපල්වලට වාරි ජලය නිකුත් කිරීමේදී ප්‍රමුඛතාවය නිමි නොවීම.	බීජ නිෂ්පාදන ගොවිපල් වලට වාරි ජලය නිකුත් කිරීමේදී ප්‍රමුඛතාවය ලැබෙන පරිදි ජාතික වැඩපිළිවෙලක් සැකසීම.	
	(1.11.) කොන්ත්‍රාත් හා පෞද්ගලික බීජ නිෂ්පාදකයින් හට කෘෂි යෙදවුම් ලබාගැනීමේදී ඇතිවන ගැටළු හේතුවෙන් බීජ නිෂ්පාදන ක්‍රියාවලියෙන් බැහැරවීම.	බීජ නිෂ්පාදකයින් සඳහා යෙදවුම් ප්‍රමුඛතාවය මත ලබාදීමේ ක්‍රමවේදයක් සැකසීම.	
	(1.12.) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් මූලික බීජ ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනය කලද, එම බීජ ගුණනය කර ශ්‍රී ලංකාවේ ගොවීන්ට අවශ්‍ය සහතික බීජ ප්‍රමාණවත්ව නිකුත් කල හැකි පරිදි පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යන ආයතන මඟින් ප්‍රමාණවත් පරිදි සහාය නොලැබීම. (1.13.) ජාතික බීජ නිෂ්පාදන වැඩසටහන ශක්තිමත් කිරීමට පළාත් හා මහවැලි අධිකාරිය මඟින් සිදුකිරීමේ ක්‍රමවේදය සඳහා අංක අමප/20/1838/323/019 දරණ 2020.12.15 දිනැති කැබිනට් අනුමැතිය ලැබී තිබුණද, එම ආයතන මඟින් ප්‍රමාණවත් පරිදි කටයුතු සිදු නොවීම.	ජාතික වැඩසටහනක් ලෙස අදාළ ආයතන මඟින් බීජ නිෂ්පාදනය සිදුකර ගැනීමට හැකි පරිදි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අවශ්‍ය බලය ලබාදීම.	

වන අලින් නිසා තම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මුහුණදීමට සිදුව ඇති ගැටළු සහ ඉන් තම කාර්යභාරය ඉටුකිරීමේදී පැමිණ ඇති බාධක හා අවහිරතා පිළිබඳව ද ග.නි. මෙහිදී අදහස් දැක්වීය.

<u>නිර්දේශ/ නියෝග</u>

දේශීය වශයෙන් බීජ නිපදවීමේ ක්‍රියාවලිය තුළ නිලධාරීන්ට තම කාර්යභාරය නිසියාකාරව ඉටුකිරීමට නොහැකි වීමට හේතුවන යම් පරිපාලනමය හෝ කළමනාකරණ ගැටළු පවතීනම් ඒවාද, එම ගැටළු / බාධා නිරාකරණය කරගත හැකි ආකාරයද වාර්තා කරන ලෙස කාරක සභාව කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍ර.ග.නි. /ග.නි. ට නියෝග කළේය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශය යටතේ ගොවිපල් 29 ක් පවත්වාගෙන යන අතර, මෙම ගොවිපල් තුළ බීජ වී, අතිරේක ආහාර බෝග බීජ, එළවළු බීජ, බීජ අර්තාපල් මූලික බීජ නිෂ්පාදන කටයුතු සිදුකරයි. මෙය සිදුකිරීමේදී කාර්යක්ෂමව හා ඵලදායීව ගොවිපල් පවත්වාගෙන යාමටත්, ඉලක්කගත අස්වනු ලබාගැනීමටත් දැනට පවතින මානව, භෞතික සම්පත් මෙන්ම දේශගුණය, වාරි ජල පහසුකම් ලැබීම, වන සතුන්ගේ හානි මෙන්ම විවිධ නීතිරීති ද බලපාන බව නිරීක්ෂණය වේ.

<u>I). ගොවිපල් තුළ කම්කරුවන් බීජ නිෂ්පාදන වැඩසටහනට සාපේක්ෂව ප්‍රමාණවත් නොවීම.</u>

සෑම බීජ නිෂ්පාදන වගාවක්ම සැළසුම් කල යුත්තේ වර්ෂාව ආරම්භයක් සමඟ හෝ වාරි ජලය මඟින් වගාව ආරම්භ කිරීමටත්, අස්වනු නෙලීමේ හා අස්වනු සැකසීමේ කාලය වර්ෂාව රහිත වියළි කාලයක් තුළ සිදුකිරීමටත්ය. එමෙන්ම, වගා වැඩසටහනක් තුළ විශේෂයෙන් කම්කරුවන්ගේ අවශ්‍යතාවය විවිධ වන අතර, එය සපයාදීම විශාල ගැටළුවක් වී ඇත. කන්නය ආරම්භයේදී හා අස්වනු නෙලීම් හා සැකසීම් කාලවකවානු තුළ උපරිම කම්කරු අවශ්‍යතාවයක් ගොවිපල් තුළ ඇතිවන අතර, එම අවශ්‍යතාවය ගොවිපල් වෙත ලබාදීමේ හැකියාවක් නොමැති බැවින් වගාවන් පිහිටුවීම හා අස්වනු නෙලීමේ හා සැකසීමේ කාලය දීර්ඝ වේ. මෙයින් දේශගුණික ගැටළු මෙන්ම අනෙකුත් බොහෝමයක් ගැටළු වලට වගාවන් භාජනය වන අතර, අවසාන ප්‍රතිඵලය ලෙස අපේක්ෂිත අස්වැන්න නොලැබීමක් ඉලක්කගත කාලයට ගොවීන්ට බීජ නිකුත් කරගැනීමටත් නොහැකිවනු ඇත. මෙයට විසඳුමක් ලෙස පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

a). දැනට ගොවිපල් වෙත අනුයුක්ත කර ඇති කම්කරුවන් ප්‍රමාණය ඉක්මවා කන්න ක්‍රමයට කම්කරුවන් බඳවාගැනීමේ බලයක් ලබාදීම.

b). ගොවිපල් සතු කම්කරුවන් ප්‍රමාණයට ඉටුකර ගැනීමට නොහැකි හඳුනාගත් කාර්යයන් ඒකක සඳහා රේටිං ක්‍රමයක් සකසා එම රේටිං ක්‍රමය අනුව කාර්යයන් ඉටුකර ගැනීම සඳහා කොන්ත්‍රාත් වැඩ ක්‍රමයක් හඳුන්වාදීම.

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

II). ගොවිපල් භූමිය බීජ නිෂ්පාදකයන් භාවිතා කිරීම.

දැනට ගොවිපල් තුළ පවතින භූමි තවදුරටත් සංවර්ධනය කර බීජ වගාවන් සඳහා භාවිතා කිරීමට තරම් ප්‍රමාණවත් මානව හා භෞතික සම්පත් ගොවිපල් සතුව නොමැති අතර, භෞතික සම්පත් ඉදිරියේදී සපයා ගත්තද, මානව සම්පතෙහි විශාල ඌණතාවයක් ගොවිපල් තුළ දක්නට ඇත. එම නිසා ජාතික බීජ අවශ්‍යතාවය මත හා බීජ ආනයනයන් සීමාකිරීම උදෙසා ගොවිපල් සතු භූමි තුළ බීජ වගාවන් තවදුරටත් වැඩිකිරීම උදෙසා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

a). ගොවිපල් සේවකයින් කොන්ත්‍රාත් බීජ නිෂ්පාදන වැඩසටහනෙහි ලියාපදිංචි කර එම බීජ නිෂ්පාදකයින්ට ජලය හා භූමිය ගොවිපල තුළින් ලබාදී බීජ නිෂ්පාදන කටයුතු සිදුකිරීම.

b). ප්‍රජා ගොවි සංවිධාන මූලික කරගෙන බීජ නිෂ්පාදන ගොවි කණ්ඩායම් බිහිකර එම කණ්ඩායම් සඳහා ගොවිපල් සතු භූමි ලබාදී බීජ නිෂ්පාදන කටයුතු සඳහා යොදවා ගැනීම.

ඉහත සඳහන් ක්‍රම දෙකෙහිම රාජ්‍ය භාගය ලෙස 10% ක හෝ ගණනය කරන ලද මුදලක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබාගැනීමට ක්‍රමවේදයක් සැකසීම.

III). ස්ථීර කම්කරුවන් බඳවාගැනීම.

ගොවිපල් තුළ බීජ නිෂ්පාදන කටයුතු සිදුකිරීමේදී කම්කරු ශ්‍රමය දෛනිකව සපුරා ගැනීම විශාල අභියෝගයක් වී ඇත. මේ සඳහා ස්ථීර කම්කරුවන් හා කොන්ත්‍රාත් කම්කරුවන් භාවිතා කරන අතර, ස්ථීර කම්කරුවන් 2014 සිට මේ වන තෙක් බඳවාගෙන නොමැති අතර, මෙම කාලවකවානුව තුළ විශාල පිරිසක් විශ්‍රාම ගොස් ඇත. සීමාසහිත කොන්ත්‍රාත් කම්කරුවන් ප්‍රමාණයක් ගොවිපල් සඳහා අනුයුක්ත කර ඇති අතර, කොන්ත්‍රාත් සේවකයින්ගේ දෛනික හා මාසික පැමිණීම සතුටුදායක මට්ටමක නොපවතී. එබැවින් ඉලක්කගත කම්කරු ඒකක සංඛ්‍යාවක් ගොවිපල තුළ සේවයේ යොදවා ගැනීමට නොහැකිවී ඇත. මෙයට පිළියමක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට දැනට පවතින කම්කරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සිදුකල යුතුය.

කේ.පී.ඩී.එච්. ප්‍රයඩිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
අංක 80 ½, "ගොවිජන මන්දිරය"
රත්මල්ලේවත්ත පටුමග, බත්තරමුල්ල.

IV). වන සතුන්ගෙන් වගාවට සිදුවන හානි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ ගොවිපල් පිහිටුවා ඇති අලුත්තරම, මහඉලුප්පල්ලම, පොළොන්නරුව, කන්තලේ, කරදියන්ආරු, මුරුන්කන්, එළුවන්කුලම යන ගොවිපල් පිහිටි ප්‍රදේශය අනුව විශේෂයෙන් වන අලි ඇතුළු වන සතුන්ගේ හානි ඉතා ඉහළ මට්ටමක පවතී. මෙම ගොවිපල් සතු භූමි ප්‍රමාණය සමස්ත ගොවිපල් 29 භූමි ප්‍රමාණයෙන් 40% ක තරම් ඉහළ අගයක් ගන්නා අතර, වන සතුන්ගෙන් සිදුවන හානි තුළින් විශාල අස්වනු ප්‍රමාණයක් හානි වන අතර, සැළකිය යුතු අස්වනු ප්‍රමාණයක ගුණාත්මකභාවය අඩුවීමක් දක්නට ලැබේ. මෙය කළමනාකරණය කරගැනීම සඳහා ගොවිපල් මට්ටමින් විදුලි වැටවල් ඉදිකිරීම, රාත්‍රී කාලයේදී මුරකරුවන් හා කම්කරුවන් යොදවාගෙන වන සතුන් පලවා හැරීම ආදිය නිතිපතා ඉටුකලත් වන සතුන්ගේ හානිය වළක්වා ගැනීමට නොහැකිවී ඇත. වන අලි ඇතුළු අනෙකුත් වන සතුන්ගෙන් වගාවන් ආරක්ෂා කරගැනීම සඳහා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

a). කන්නයට වගා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් (ශ්‍රමය) ගොවිපල් සඳහා ලබාදීම.

b). වනජීවී දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එකතුව විධිමත් වැඩසටහන් වන සතුන් ගොවිපල් තුළට පැමිණීම වළක්වා ගැනීම සඳහා සකස් කිරීම.

V). වාරි ජල පහසුකම් විධිමත්ව ලබාගැනීම.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොවිපල් බහුතරය තුළ බීජ නිෂ්පාදනය ක්‍රියාවලිය සිදුකරනු ලබන්නේ වාරි ජල සම්පාදන ක්‍රමය යටතේය. මෙම ගොවිපල් හෙක්ටයාර 40 සිට හෙක්ටයාර 225 ප්‍රමාණයෙන් විශාලත්වයක් දරණු ලබයි. මෙම ගොවිපල් තුළ පවතින සම්පත් අනුව ඉලක්කගත වගා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැළකිය යුතු කාලයක් ගතවන අතර, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ජලය ලැබෙනුයේ සාමාන්‍ය ගොවීන් වගා කරන හෙක්ටයාර 1ත් හෙක්ටයාර 5ත් අතර භූමියකට සරිලන සැලැස්මක් යටතේය. එම සැලැස්ම අනුව ගොවිපලට වගාව පිහිටුවීමට නොහැකි බවක් නිරීක්ෂණය වේ. එම නිසා ගොවිපලක් තුළ ජල අවශ්‍යතාවය හඳුනාගෙන වාරි ජලය ලබාගත යුතුව ඇත. ඒ සඳහා පහත යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

කෘෂිකර්ම සහ වනජීවී
අංක. 80/5,"ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

a) බීජ නිෂ්පාදනය ජාතික අවශ්‍යතාවයක් සේ සළකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ එකතු වී ජාතික සැලැස්මක් අනුව වාරි ජලය ලබාදීම ගොවිපල් පිහිටි ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීම.

b) ගොවිපල් තුළ ජලය ගබඩා කිරීමට හැකි වපසරිය වැඩිකිරීම හා ජල මාර්ග විධිමත් කිරීම.

VI). නිලධාරීන් සඳහා පහසුකම් ලබාදීම.

ගොවිපල් පිහිටා ඇත්තේ රට තුළ දුෂ්කර ප්‍රදේශවල බැවින්, නිලධාරීන් ආකර්ශණය කරගැනීම හා රඳවාගැනීම ඉතා දුෂ්කර කාර්යයක් වී ඇත. බොහොමයක් කාර්යයන් තාක්ෂණික නිලධාරීන්ගේ අධීක්ෂණය මත සිදුකල යුතු බැවින්, ගොවිපල් තුළ ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් සිටීම ඉතා වැදගත් වේ. ඒ අනුව පහත සඳහන් යෝජනා ඉදිරිපත් කරනු ලැබේ.

a). ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ තාක්ෂණ සේවය සඳහා නිලධාරීන් බඳවාගැනීම.

b). ගොවිපල් දීමනාව වැඩිකිරීම.

c). නිවාඩු දින හෝ සාමාන්‍ය සේවා වේලාවෙන් ඔබ්බට වැඩ කිරීමේදී ඒ සඳහා අතිකාල දීමනා ලබාදීම.

d). නිල නිවාස නොමිලේ ලබාදීම.

e). ප්‍රවාහන පහසුකම් හා ඉන්ධන ලබාදීම.

...ulture and Plantation Industries
..., "Govijana Mandiraya",
...Isiri Gamini Mawatha Avenue, Battaramulla.

කේ.ජී.ඩී.එච්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාරමග, බත්තරමුල්ල.

VII). අඛණ්ඩ ප්‍රතිපාදන වාර්ෂිකව ලබාදීම.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොවිපල් පිහිටුවා ඇත්තේ 1940 දශකයේ සිට 1960 දශකය දක්වා වූ කාලවකවානුව තුළ වන අතර, මේ වන විට වසර 60 ක් පමණ ගතවී ඇති බැවින්, ගොවිපල් සතු භෞතික සම්පත් මේ වන විට නැවත ප්‍රතිසංස්කරණය කිරීමට සිදුවී ඇත. එසේම, බීජ නිෂ්පාදන වැඩසටහන් පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම තුළින් ඇතිවන අවශ්‍යතාවය සඳහා නවදුරටත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සිදුවී ඇත. එමෙන්ම නවීන තාක්ෂණය හා ක්‍රමවේදයන් බීජ නිෂ්පාදනයට යොදවා ගැනීමට සිදුවන බැවින් ගොවිපල් සඳහා යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මිළදීගැනීම නිරන්තරයෙන් ඇතිවේ. එමෙන්ම දේශගුණික වෙනස්වීම් මත ජල සම්පාදන ක්‍රමවේදය දියුණු කිරීමට සිදුවන බැවින්, ඒ සඳහාද වාර්ෂිකව ආයෝජනය කිරීමට සිදුවේ. තවද, රට තුළ බීජ අවශ්‍යතාවය නිෂ්පාදනය කිරීමටත්, ඒවා ස්වාරක්ෂිත තොග පවත්වාගෙන යාමටත්, ගබඩා හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටත් සිදුවේ. ඉහත සඳහන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩ වශයෙන් ගොවිපල් සංවර්ධන ආයෝජන සිදුකිරීම සඳහා ජාතික අවශ්‍යතාවයක් සේ සළකා කඩිනම් ගොවිපල් සංවර්ධන වැඩසටහන යටතේ අඛණ්ඩ ප්‍රතිපාදන ලබාදීම.

කේ.ජී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ප්‍රේමාවතී ධර්මකීර්ති
මෙහෙයුම්
කෘෂිකර්ම හා මැවිලි සම්පත් අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

07. කාරක සභාවට ඉදිරිපත් කල යුතු වාර්තා

1. දේශීය වශයෙන් බීජ නිෂ්පාදනය වැඩිකිරීම සඳහා බාධාවක් ලෙස සඳහන් කෙරුණු සේවක පුරප්පාඩු පිළිබඳව හා ඒ සඳහා නව බඳවාගැනීම් සිදුකිරීමට ඇති බාධාවන් කුමක්දැයි සඳහන් කරමින් වාර්තාවක් සතියක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස **කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ අංශ, එක් එක් කාර්යාංශවලට නියමිත හා තත්‍ය සේවක සංඛ්‍යාවන්, එක් එක් අංශවල පවතින පුරප්පාඩු සංඛ්‍යාවන් සහ එම පුරප්පාඩු පිරවීමට නොහැකිවීමට හේතු සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.**	මේ සම්බන්ධයෙන් වන වර්තමාන තත්ත්වය පහත පරිදි ඉදිරිපත් කරමි. <u>ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව</u> ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ එවකට පුරප්පාඩු 756 ක් පැවැතිය ද, බඳවාගැනීම සම්බන්ධයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර තිබූ SC(FR) 283/2014 අංක දරණ පෙත්සම 2021.03.08 දින විභාග කරන අවස්ථාවේදී පෙත්සම්කරුවන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණ පෙත්සම සම්බන්ධයෙන් සමථයකට එළඹීම සඳහා එකඟතාවය පලකර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ III ශ්‍රේණියේ 2020.06.30 දිනට පැවති පුරප්පාඩු 678 න් පුරප්පාඩු 310 ක් සඳහා විවෘත පදනම මත බඳවාගැනීමේ ගැසට් නිවේදනයක් හා සංශෝධිත සුදුසුකම් යටතේ සීමිත පදනම මත බඳවාගැනීමේ ගැසට් නිවේදනයක් වශයෙන් වෙන් වෙන්ව සකස් කල ගැසට් නිවේදන දෙකක් මඟින් අයදුම්පත් කැඳවා සීමිත තරඟ විභාගය 2023.02.19 දිනත්, විවෘත තරඟ විභාගය 2023.04.08 හා 09 දෙදිනත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වා ඇත. මේ වන විට සීමිත පදනම මත විභාගය සඳහා පෙනී සිට විභාගය සමත් අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු මෙන් දෙගුණයක් ලෙස අයදුම්කරුවන්ගේ නාමලේඛනය විභාග දෙපාර්තමේන්තුව විසින් යොමුකර ඇත. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය 2023.10.23 දින සිට 2023.10.26 දින දක්වා පැවැත්වීමට කටයුතු කරමින් පවතී. එමඟින් සීමිත පදනම මත පැවති පුරප්පාඩු 148 ක් සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. විවෘත පදනම මත තනතුරු 162 ක් සඳහා බඳවාගැනීමට නියමිත අතර, එම විභාගයේ ප්‍රතිඵල මේ වන තෙක් විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොමැත. එම ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව ඉහතින් දක්වා ඇති පුරප්පාඩු 310 සම්පූර්ණ කිරීමට අපේක්ෂිතය. එම බඳවාගැනීම් වලින් පසු 2023.06.30 දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විවෘත පදනම මත පුරප්පාඩු 234 ක් හා සීමිත පදනම මත පුරප්පාඩු 215 ක් වශයෙන් මුළු පුරප්පාඩු ගණන 449 කි. එයින් විවෘත පදනම මත වූ පුරප්පාඩු 234 සඳහා "රජයේ විධායක ශ්‍රේණියට බඳවාගැනීමේ පොදු තරඟ විභාගය" මඟින් බඳවාගැනීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත්පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර, එමෙන්ම සීමිත පදනම මත පුරප්පාඩු 215 බඳවාගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදන සකස් කර ඇත.

Jayantha Dharmakeerthi
Secretary
Ministry of Agriculture and Plantation Industries
No. 80/5, "Govijana Mandiraya"
Rajamalwatta Avenue, Battaramulla.

28

කේ.පී.ඩී.එච්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රාජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	<u>කෘෂිකර්ම උපදේශක හා පර්යේෂණ සහකාර</u> කෘෂිකර්ම උපදේශක හා පර්යේෂණ සහකාර තනතුරුවලට අදාළ ඒ වන විට පුරප්පාඩු සංඛ්‍යාව 446 ක් ලෙස පැවතිය ද, වර්තමානය වන විට මුළු පුරප්පාඩු සංඛ්‍යාව 555 කි. ඒ අනුව, 2021.12.31 දිනට පැවති කෘෂිකර්ම උපදේශක තනතුරට අදාළව සීමිත පදනම මත පුරප්පාඩු 110 ක් සඳහා බඳවාගැනීමේ තරඟ විභාගය 2023.08.12 දින විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ඇත. තවද, ඉන්පසු ඇතිවූ පුරප්පාඩු 309 (සීමිත - 93, විවෘත - 216) ක් බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත. පර්යේෂණ සහකාර තනතුරට අදාළව 2021.12.31 දිනට සීමිත පදනම මත පුරප්පාඩු 30 ක් සඳහා බඳවා ගැනීමේ තරඟ විභාගය 2023.08.12 දින විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ඇත. මෙම තනතුරේද පසුව ඇතිවූ පුරප්පාඩු 97 (සීමිත 29, විවෘත - 68) ක් බඳවාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇත. <u>ස්ථිර කම්කරු</u> බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට අදාළව එවකට පැවති ස්ථිර කම්කරු පුරප්පාඩු සංඛ්‍යාව 191 ක් ලෙස දක්වා ඇතත්, මේ වන විට පුරප්පාඩු සංඛ්‍යාව 207 කි. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2014 අනුව කොන්ත්‍රාත් කම්කරුවන් ස්ථිර කිරීම සඳහා ඉල්ලා ඇති අතර, අංක අමප/23/1102/612/033 හා 2023.06.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් රජය විසින් ඉදිරියේදී ගනු ලබන හුදු ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමෙන් අනතුරුව එම සංදේශය සම්බන්ධව සළකා බලන බව තීරණය කර ඇති බව දන්වා ඇති බැවින්, දැනට දෙපාර්තමේන්තුව තුළ සේවයේ නියුතු කොන්ත්‍රාත් කම්කරුවන් මඟින් මෙම ස්ථිර කම්කරු තනතුරට අදාළ රාජකාරි ඉටුකර ගන්නා අතර, ඉදිරියේදී රජය මඟින් ගන්නා ප්‍රතිපත්තිමය තීරණ මත මෙම පුරප්පාඩුවල කම්කරුවන් ස්ථිර කිරීමට කටයුතු කෙරේ. මගේ අංක කෘදෙ/පා/1/4/3/1-IV (තාව) සහ 2023.01.11 දිනැති ලිපිය මඟින් පුරප්පාඩු තනතුරු සඳහා නව බඳවාගැනීම් සිදුකරන තෙක් තම අංශය තුළම මානව සම්පත කළමනාකරණය කරගැනීම කල යුතු බවත්, පවතින තත්ත්වය මත අත්‍යාවශ්‍යම තනතුරක පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට අවශ්‍ය අවස්ථාවක එය වෙනත් අධ්‍යක්ෂ අංශයක් සමඟින් හෝ අංශය තුළ වෙනුත් ඒකකයක් සමඟින් ගළපා

කේ.ජී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රාජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මසිරිපති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රාජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	ගත හැකි නම් ඒ පිළිබඳව අවධානය යොමුකර කටයුතු කරමින් පවතී.
2. පසුගිය වසර තුනක කාලයක් තුළ සමස්ත බීජ ඉල්ලුමට සහ සැපයුමට ගැලපෙන පරිදි දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හා ආනයනය කරන බීජ ප්‍රතිශතය කොපමණද යන්නත් සහ එම ප්‍රමාණයෙන් පෞද්ගලික අංශය හා රාජ්‍ය අංශය ලෙස වෙන් වශයෙන් නිපදවන ප්‍රමාණයන් පිළිබඳ වාර්තාවක් දෙසතියක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස, **අදාළ දත්ත ඇතුළත් වාර්තා ඉදිරිපත් කර ඇත.**	මගේ අංක කෘදෙ/මු/8/6/2021/37 හා 2022.11.28 දිනැති ලිපිය මඟින් අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. සංශෝධිත වාර්තාව ඇමුණුම **01** ලෙස මේ සමඟ අමුණා ඇත.
3. බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියේ සඳහන් කරුණු ආවරණය කරමින් ප්‍රකාශයට පත්කොට, පාර්ලිමේන්තුවේ සම්මත වී ඇති 2003 අංක 22 දරණ බීජ පනතට අනුකූලව බීජවල මිළ පාලනය සඳහා පවතින ගැටළු හා එම ගැටළු නිරාකරණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න පිළිබඳ වාර්තාවක් දෙසතියක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස, **බීජවල මිළ සම්බන්ධ වර්තමාන තත්ත්වය හා බීජවල මිළ නියාමනය කිරීම පිළිබඳ රෙගුලාසි සකස් කිරීමට අදාළ වාර්තාවක් ඉදිරිපත් කර ඇත.**	මගේ අංක කෘදෙ/මු/8/6/2021/37 හා 2022.11.28 දිනැති ලිපිය මඟින් අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇත. **බීජ වල මිළ නියාමනය කිරීම පිළිබඳ රෙගුලාසි සකස් කිරීම.** බීජ හා රෝපණ ද්‍රව්‍ය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තියේ සඳහන් කරුණු ආවරණය කරමින් ප්‍රකාශයට පත්කොට, පාර්ලිමේන්තුවේ සම්මත වී ඇති 2003 අංක 22 දරණ බීජ පනතට අනුකූලව බීජ වල මිළ පාලනය සඳහා පවතින ගැටළු හා එම ගැටළු නිරාකරණය සඳහා ගතයුතු ක්‍රියාමාර්ග. **එළවළු බීජ කර්මාන්තයේ මිළ සම්බන්ධ වර්තමාන තත්ත්වය.** පුද්ගලික අංශය විසින් දේශීයව විවෘත පරාගිත ප්‍රභේදවල බීජ හා දෙමුහුම් බීජ නිෂ්පාදනය කරන අතරම, වැඩි වශයෙන් ආනයනික, විවෘත පරාගිත හෝ දෙමුහුම් බීජ සැපයීම ද සිදුකරයි. එළවළු බෝග නිෂ්පාදනයේදී නිෂ්පාදන පිරිවැය ගණනයේදී බීජ සඳහා වන වියදම ප්‍රධාන සාධකයක් වේ. වැයවන පිරිවැයෙන් බීජ සඳහා වන වියදම 3% සිට 10% දක්වා අගයක් ගන්නා අතර, බීජ වල මිළ විශාල වශයෙන් විචලනයක් දක්නට ලැබේ. බීජ වල මිළ, බෝගය, ප්‍රභේදය (දෙමුහුම් හෝ විවෘත පරාගිත

Jayantha Dharmakeerthi
Secretary
Ministry of Agriculture and Plantation Industries
No. 80/5, "Govijana Mandiraya",
Rajagiriya, Battaramulla.

30

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රාජගිරිය පදිංචිය, බත්තරමුල්ල.

ප්‍රභේදයක්ද), ප්‍රභවය (දේශීය, ආනයනික) ව්‍යවසායකත්වය (රාජ්‍ය, පුද්ගලික), වෙළඳ ප්‍රචාරණය ආදිය මත විචල්‍යය වේ.

බීජ වල වෙළඳපළ මිළ තීරණය කරන ප්‍රධාන සාධක.

1. විවෘත පරාගිත ප්‍රභේදවල බීජවල මිළ, බීජ නිෂ්පාදනය, ප්‍රවාහනය, ඇසුරුම්කරණ, අලෙවිකරණ වියදම් හා ලාභාංශය මත විචලනය වේ.

2. දේශීයව බීජ නිෂ්පාදනය සැළකීමේදී ජල සම්පාදන ක්‍රම, ආරක්ෂිත ගෘහ, ඇසුරුම් සඳහා වන වියදම් ආදිය ස්ථාවර වියදම් සඳහා බලපාන ප්‍රධාන සාධක ලෙස සැළකිය හැකිය. දේශීයව බීජ නිෂ්පාදනය සඳහා වැයවන විචල්‍යය වියදම් ලෙස, වැයවන ශ්‍රමය, ඉන්ධන, පොහොර හා කෘෂිරසායන, අස්වනු නෙලීම, ජල කළමනාකරණය, රෝග හා පළිබෝධ මර්ධනය, වල් මර්ධනය ආදිය සඳහා වන වියදම් ප්‍රධාන වියදම් ලෙස ගත හැකිය.

3. 2003 අංක 22 දරණ බීජ පනත මඟින් බීජ වල ගුණාත්මකභාවය නියාමනය කිරීම සඳහා පහසුකම් සළසා තිබුණද, මිළ නියාමනය සඳහා බලය ලබාදී නොමැත. කෙසේ වුවත්, මේ වන විට වෙළඳපලෙහි ප්‍රධාන කාණ්ඩ 05 ක් (දේශීය විවෘත පරාගිත, දේශීය දෙමුහුම්, ආනයනික විවෘත පරාගිත, ආනයනික දෙමුහුම්, පාරම්පරික ප්‍රභේද ලෙස) යටතේ ඉතා විශාල බීජ වර්ග (බීජ වර්ග 250 ක් පමණ) අලෙවි වේ. ඒවායේ මිළ විශාල පරාසයක විචල්‍ය වේ. මේ අනුව, එක් එක් බෝග ප්‍රභේදය සඳහා මිළ නියම කල යුතු වුවත් මෙය ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් බැවින් එය ප්‍රායෝගික නොවේ. එබැවින් ඉහත සාධකයන් සියල්ල සැළකිල්ලට ගෙන එක් එක් බෝගය සඳහා උපරිම මිළක් නියම කිරීම සුදුසු වේ.

යෝජනා

1. දේශීය වර්ග, දේශීයව නිපදවන දෙමුහුම් හා විවෘත පරාගිත බීජ වර්ග සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කමිටුවක් මඟින් කාලානුරූපීව බීජ මිළ නිර්ණය කිරීම.

2. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බීජ නිෂ්පාදනය තවදුරටත් ශක්තිමත් කර තරහකාරීත්වය වැඩිකිරීම.

3. ගොවීන්, ගොවි සංවිධාන හා පෞද්ගලික අංශයේ දේශීය බීජ නිෂ්පාදනය සඳහා පහසුකම්

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ප්‍රධාන
කෘෂිකර්ම සහ වැඩිලි සංවර්ධන දෙපාර්තමේන්තුව
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

	පුළුල් කර යෙදවුම් සඳහා සහන ලබාදීම තුළින් බීජ නිෂ්පාදකයින් දිරිගැන්වීම. 4. කන්නය ආරම්භයේදී ගොවිබිමට බීජ ගෙනයාමේ වැඩපිළිවෙල පුළුල් කිරීම හා ඒ සඳහා රාජ්‍ය අංශයේ පහසුකම් වැඩිදියුණු කිරීම. 5. කෘෂිකර්ම අමාත්‍යාංශය මැදිහත්වීම මත වැඩි වශයෙන් වගා වන හා ඉහළ මිළක් සහිත බෝග බීජ සඳහා පමණක් බීජ අළෙවි මිළ නියාමනය කිරීමේ යාන්ත්‍රණයක් පෞද්ගලික අංශයේ සහභාගිත්වයද ඇතිව සැකසීම. 6. බීජ නිෂ්පාදකයන් හා අළෙවිකරුවන් සඳහා රක්ෂණාවරණ ක්‍රමයක් ඇතිකිරීම. බීජ සඳහා උපරිම මිළක් නියම කිරීමට කමිටුවක් පත්කිරීම සුදුසු බවට තීරණය කරන ලද අතර, මේ පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි පැවති ජාතික බීජ කමිටුවේදී සාකච්ඡා කරන ලදි. (පෞද්ගලික අංශයත් ඇතුළුව) එහිදී පෞද්ගලික අංශය විසින් මිළ සඳහා පවතින ගැටළු පැහැදිළි කරන ලදි. රජය පෞද්ගලික අංශය සමඟ තවදුරටත් සාකච්ඡා කර මිළ නියාමනය පිළිබඳව තීරණ ගැනීම සුදුසු බව තීරණය කරන ලදි. ඒ අනුව 2023.11.07 දින සියලු පාර්ශවකරුවන් සමග රැස්වීමක් පැවැත්වීමට සංවිධානය කර ඇත.
4. දේශීය වශයෙන් බීජ ප්‍රවර්ධනයට රජය විසින් කොපමණ පිරිවැයක් දරා තිබේද හා එයට සාපේක්ෂව බීජ නිෂ්පාදකයින් විසින් මේ වන විට කොපමණ බීජ ප්‍රමාණයක් නිෂ්පාදනය කොට තිබේද යන්න පිළිබඳ දත්ත ඇතුළත් වාර්තාවක් දෙසතියක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස **දේශීය බීජ නිෂ්පාදනයේ වර්තමාන ප්‍රගතිය, ගොවි ජනතාව අතර දේශීය බීජ සුලභ කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ගැන වාර්තාවක්ද, විගණන වාර්තාවේ නිර්දේශ සඳහා පිළිතුරු ඇතුළත් වාර්තාවක් ද ඉදිරිපත් කර ඇත.**	මේ සම්බන්ධ වර්තමාන තත්ත්වය ඇමුණුම **02** යටතේ ඉදිරිපත් කර ඇත.

Janaka Dharmakeerthi
Secretary
...culture and Plantation Industries
..., "Govijana Mandiraya",
...Gothatabhaya Avenue, Battaramulla.

කේ.ජී.ඩී.එච්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
ථූපාරාමවර්ධන පටුමග, බත්තරමුල්ල.

ආයතනයේ නම : කෘෂිකර්ම අමාත්‍යාංශය

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂිත සහල් සංචිත පවත්වාගෙන යාම හා ගබඩා උපයෝජනයේ කාර්යසාධනය පිලිබඳ විශේෂ විගණන වාර්තාව විමර්ශනය කරන ලද දිනය - 2022 ඔක්තෝබර් 20	
කාරක සභාව විසින් හදුනාගත් අඩුපාඩු /කාරක සභාව විසින් දෙන ලද නියෝග	කමිටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
06. ආරක්ෂිත සහල් සංචිත පවතිවාගෙන යාමට නොහැකි වීම.	
2005 වර්ෂය දක්වා තම දෙපාර්තමේන්තුව දිසත්‍රික් ලේකම්වරුන් මාර්ගයෙන් ගොවීන්ගෙන් වී මිලදීගෙන සහල් බවට පත් කොට සංචිත පවත්වාගෙන ගිය බවත්, 2006 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වසා දැමූ බවත්, නැවත 2008 වර්ෂයේදී ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසුව වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා නොදුන් බැවින් සංචිත පවත්වාගෙන යාමට නොහැකි වූ බවත් මේ පිළිබඳ අදහස් දක්වමින් ආහාර දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය.මේ සඳහා වාර්ෂිකව රු. බිලියන 22ක පමණ මුදලක් ප්‍රතිපාදන අවශ්‍ය බවද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. 2005 වර්ශයෙන් පසුව සහල් සංචිත පවත්වාගෙන යාම සඳහා රජයෙන් ප්‍රතිපාදන නොලැබෙන පසුබිමක, 2012 වර්ෂයේදී රු. මිලියන 292ක් වැය කරමින් ගබඩා නවීකරණය කිරීම ජනතා මුදල් නාස්ති කිරීමක් බව කාරක සභාවේ අදහස විය. නවීකරනය කළ ගබඩාවල ධාරිතාවය මෙට්‍රික් ටොන් 34,000 කට අධික වුවත් එපමණ ප්‍රමාණයක සහල් රට තුළ නොමැති පෙන්වා දුන් කාරක සභාව ව්‍යාපෘති ආරම්භ කිරීමේදී ආයතන අතර මනා සම්බන්ධීකරණයක් නොමැති බව මෙමගින් පැහැදිලි වන බව අවධාරණය කළේය.	• ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ රජයට අයත් ගබඩා සම්බන්ධයෙන් තොරතුරු ඇමුණුම් 03 මගින් ඉදිරිපත් කර ඇත • වී අලෙවි මණ්ඩලයේ පෙර ඉදිරිපත් කර ඇති වාර්තාව තුල ඇති ගබඩා 356 ක ප්‍රමාණය වෙනුවට ගබඩා 353 ක් ලෙස සංශෝධනය වී ඇත. ඊට හේතුව නැගෙනහිර කලාපයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කලවන්චිකුඩි 01,02, අරසඩතිව් 01,02 සහ කලිවියන්කාඩු යන ගබඩා නැවතත් අදාළ ආයතන වෙත ලබාදීමට කටයුතු කර ඇති බැවිනි. • ඒ අනුව වී අලෙවි මණ්ඩලය සතු යාවත්කාලීන කර ඇති නව ගබඩා ලැයිස්තුව ඇමුණුම් 04 මගින් ඉදිරිපත් කර ඇත

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක ධර්මකීර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැඩිදුර සංවර්ධන අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

එමෙන්ම රජය හා අමාත්‍යාවරුන් වෙනස්වන විට ස්වකීය අවශ්‍යතාවන් පරිදි ප්‍රතිපත්ති වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ ආකාරයට ජනතා මුදල් නිකරුණේ නාස්ති වන බව පෙන්වා දුන් කාරක සභාව, ස්ථාවර ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාවද අවධාරණය කළේය.

<u>නිර්දේශ/ නියෝග</u>

වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඒවාට අනුබද්ධ ආයතන සතු ගබඩා පිළිබඳව නිවැරදි දත්ත නොමැතිවීම පිළිබඳ අවධානය යොමු කළ කාරක සභාව, රටෙහි විවිධ ප්‍රදේශවල ඇති රජයට අයත් ගබඩා සම්බන්ධයෙන් අදාළ දිසත්‍රික් ලේකම්වරුන්ගේ සහ අනෙකුත් ආයතනවලද සම්බන්ධීකරණයෙන් පූර්ණ අධ්‍යයනයක් සිදු කොට පහත සඳහන් තොරතුරු ඇතුළත් සවිස්තර වාර්ථාවක් මාසයක කාලයක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වෙත නියෝග කළේය.

- ආයතනය යටතේ පවතින සමස්ත ගබඩා ප්‍රමාණය.
- එක් එක් ගබඩාව පිහිටා ඇති ස්ථානය.
- එක් එක් ගබඩාවේ ධාරිතාවය.
- එක් එක් ගබඩාවේ භිමිකාරීත්වය පිළිබඳ වර්තමාන තත්ත්වය.
- වෙනත් පාර්ශවයක් විසින් අනවසරයෙන් අත්පත්කරගෙන ඇති ගබඩා පවතී නම් ඒවා කවරේද?

• කුලී පදනම මත ලබා ගෙන ඇති ගබඩා පිළිබඳ තොරතුරු (ගබඩා ලබා දී ඇති ආයතන, ගබඩා ලබා දී ඇත්තේ විධිමත්ව ගිවිසුමක් සහිතවද, ගිවිසුම්ගත නොවී ගබඩා ලබා දී තිබේ නම් ඊට වගකිවයුතු නිලධාරීන්ගේ නම් සහ තනතුරු, හිඟ කුලී පවතී නම් ප්‍රමාණයන් සහ අදාළ ආයතන වෙන් වෙන්

Secretary
Plantations and Plantation...
Ministry of Co-operative Development...
Sri Lanka Avenue, Battaramulla...

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "ගොවිජන මන්දිරය"
රජ්මල්වත්ත පටුමග, බත්තරමුල්ල.

වශයෙන්) • ගබඩාවල වර්ථමාන තත්ත්වය o භාවිතයට ගෙන ඇති/නැති බව o අලුත්වැඩියා කළ යුතුද/නැද්ද • නවීකරනය කරන ලද ගබඩාවල ගැටළු පවතින්නේද? ඒ කවරේද? *අදාළ වාර්තාව ලැබී ඇත.	

කේ.පී.ඩී.එන්. ජයසිංහ
ප්‍රධාන ගණකාධිකාරී
කෘෂිකර්ම අමාත්‍යාංශය
අංක 80/5, "හෝපිප්ප මන්දිරය"
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

ජානක වික්‍රමතිර්ති
ලේකම්
කෘෂිකර්ම සහ වැවිලි යටිතල අමාත්‍යාංශය
අංක. 80/5, "හෝපිප්ප මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.